## PPSC Circular No : AD/Rec/REV/2024

**නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම - 2024**

නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති පළාත් ආදායම් සේවයේ නිලධාරින්ගෙන් හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම බඳවා ගැනීම සිදුකරනු ලබන තනතුරු වන්නේ,

(i) පළාත් නියෝජ්‍ය කොමසාරිස්
(ii) පළාත් තක්සේරුකරු
(iii) බදු නිලධාරි

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය **30.04.2024** වේ.

**2. බඳවා ගැනීමේ ක්‍රමය :-**

**2.1.** මෙම දැන්වීමට අනුව අයදුම්කරනු ලබන පළාත් ආදායම් සේවයේ නිලධාරින් හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ නිලධාරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයේදී නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත ලකුණු පරිපාටියක් අනුව අයදුම්කරුවන් වෙත ලකුණු ලබා දෙනු ලබන අතර එහිදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත මෙම තෝරාගැනීම සිදු කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන නිලධාරියා පළාත් ආදායම් සේවයේ හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ තමා දරන තනතුරින් ස්ථිරව නිදහස් වී පැමිණිය යුතුය.

**3. සුදුසුකම් :-**

**1. නියෝජ්‍ය කොමසාරිස් :**

(i) පළාත් ආදායම් සේවයේ (ඕනෑම පළාතක) හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**සටහන** : පළාත් ආදායම් සේවයේ හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ I වන ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරියෙකු නොමැති අවස්ථාවකදී, පළාත් ආදායම් සේවයේ (ඕනෑම පළාතක) හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ 2 වන පන්තියේ I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු මෙම තනතුර සඳහා සළකා බලනු ලැබේ.

**2. පළාත් තක්සේරුකරු :**

(i) පළාත් ආදායම් සේවයේ (ඕනෑම පළාතක) හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ තක්සේරුකරු තනතුරේ 2 වන පන්තියේ I/II ශ්‍රේණි වල නිලධාරියෙකු වීම.

**3. බදු නිලධාරි:**

(i) පළාත් ආදායම් සේවයේ (ඕනෑම පළාතක) හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ බදු නිලධාරි තනතුරේ 3 වන පන්තියේ I/II ශ්‍රේණි වල නිලධාරියෙකු වීම.

**4. අයදුම්කිරීමේ ක්‍රමය :-**

**4.1.** මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

**4.2. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති සංකේත අංකය නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම අභ්‍යන්තර චක්‍රලේඛයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

**4.3.** මෙම තනතුරු සඳහා අයදුම් කරනු ලබන ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින් ඔවුන්ගේ අයදුම්පත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු විසින් නිර්දේශ කර තිබිය යුතු අතර පළාත් සභාවන්හි සේවයේ නියුතු නිලධාරින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්/පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහිතව අයදුම්පත් යොමුකළ යුතුය. සෑම අයදුම්පත්‍රයකම, අයදුම්කරු මෙම තනතුරට තෝරා ගතහොත් ඒ සඳහා නිදහස් කළ හැකි බවට වන කොටස නිවැරදිව සම්පූර්ණ කර තිබිය යුතුය.

**4.4.** නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **30.04.2024.** වන දිනට හෝ ඊදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ. **(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
අංක: 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය.

**4.5.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **AD/Rec/REV/2024, "නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම - 2024"** ලෙස සඳහන් කළ යුතුය.

**4.6.** ඉහත 2.1 වගන්තියේ ප්‍රතිපාදන වලට යටත්ව මෙම නිවේදනයෙහි සඳහන් සුදුසුකම් **30.04.2024.** දින හෝ ඊදිනට පෙර සපුරා ඇති බවට සනාථ කෙරෙන ලියකියවිලි ඉදිරිපත් කරන සහ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන්, ඉහත සඳහන් කර ඇති ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. උක්ත සම්මුඛ පරීක්ෂණයට කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. නියමිත සුදුසුකම් සපුරා නොගෙන මෙම තනතුර සඳහා අයදුම්කිරීම වරදක් සේ සලකනු ලැබේ.

**5. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-**

සෑම අයදුම්කරුවකුම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

**6. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ සැපයිය යුතු තොරතුරක් හිතාමතා සැපයීම පැහැර හැර ඇති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහුට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හා ඔහුට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පිළිවන.

**7. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-**

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| (i) ජ්‍යෙෂ්ඨත්වය | 30 |
| (ii) කුසලතාවය | 20 |
| (iii) සේවා පළපුරුද්ද | 15 |
| (iv) අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| (v) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 |
| මුළු ලකුණු | 100 |

*ලකුණු ලබාදීමේ පිළිවෙළ :*

ව්‍යුහගත සම්මුඛ පරීකෂණයේදී ලකුණු ලබාදීමේ ආකාරය පිලිබඳ විස්තර "ඇමුණුම 1" හි දැක්වේ.

**8.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**9.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී පවත්වනු ලැබේ.

**10.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. ඉල්ලා ඇති නමුත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**11.** මෙම අභ්‍යන්තර චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම පත්වීම සිදුකිරීම හෝ නොකිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතු වේ.

**ඒ. මන්සූර්,**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

දිනය : 2024.04.09

**AD/Rec/REV/2024**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම - 2024**

භාෂා මාධ්‍යය
සිංහල - S දෙමළ - T
(අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න)

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: ……………………………………

| | |
|---|---|
| නියෝජ්‍ය කොමසාරිස් | |
| පළාත් තක්සේරුකරු | |
| බදු නිලධාරී | |

(අයදුම්කරන තනතුර ඉදිරියෙන් "✓" ලකුණ යොදන්න)

**1.0** i. නිලධාරියාගේ නම : Rev/Mr/Mrs/Miss ……………………………………………………

ii. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය : ……………………………………………………
……………………………………………………
……………………………………………………

iii. දැනට දරන තනතුර : ……………………………………………………..

iv. අයත් සේවාව : ……………………………………………………………..

v. උපන් දිනය : ……………………………………………………………..

vi. පන්තිය හා ශ්‍රේණිය : ……………………………………………..

vii. සේවා කාලය තුළ ලබා ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :

| සිට | දක්වා | අවුරුදු මාස දින |
|---|---|---|
| ………………………… | ……………………………. | …………………………….. |
| ………………………… | ……………………………. | …………………………….. |
| ………………………… | ……………………………. | …………………………….. |

viii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අදාල ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය :

අවු ………… මාස ………… දින …………

ix. සේවා කාලය තුළ ලබා ඇති සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර :

| සේවා ස්ථානය | සේවය කළ කාල සීමාව | | කාලය |
|---|---|---|---|
| | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | අවුරුදු මාස දින |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

x. සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනට පූර්වාසන්න වර්ෂ 5 තුළ ලබා ඇති කාර්යය සාධන මට්ටම් පිළිබඳ විස්තර (අදාල නොවන වචන කපා හරින්න)

| වර්ෂය | ලබා ඇති කාර්යය සාධන මට්ටම් |
|---|---|
| 2018 | විශිෂ්ඨ/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/ සතුටුදායක |
| 2019 | විශිෂ්ඨ/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/ සතුටුදායක |
| 2020 | විශිෂ්ඨ/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/ සතුටුදායක |
| 2021 | විශිෂ්ඨ/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/ සතුටුදායක |
| 2022 | විශිෂ්ඨ/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/ සතුටුදායක |

## 2.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) තවද, ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය: ………………………..……                                        ..…………………..……… 
අයදුම්කරුගේ අත්සන

## 3.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

……………………………………..……………………මහතා/ මහත්මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..……………………..…………...………….
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම : ………………………..…….
තනතුර : ………………………..…….
ලිපිනය : ………………………..…….
*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*

දිනය : ………………………..…….

## 4.0 පළාත් ප්‍රධාන ලේකම්/ආදායම් කොමසාරිස් ජනරාල්/පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ නිර්දේශය

……………………………………..……………………මහතා/ මහත්මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය උක්ත තනතුර සඳහා තෝරා ගතහොත් මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ සේවයෙන් නිදහස් කළ හැකි බවද දන්වමි.

..……………………..…………...………….
අත්සන

නම : ………………………..…….
තනතුර : ………………………..…….
ලිපිනය : ………………………..…….
*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*

දිනය : ………………………..…….